# ශ්‍රී ලංකාවේ පුරාණ ගිණුම්කරණය පිළිබඳ සෙල්ලිපි ඇසුරින් අධ්‍යයනයක්


අයි.ආර්.අයි.බී.ජී.එස්.එච්. බණ්ඩාර[*], එම්.ඩබ්.අයි.කේ. දේශප්‍රිය[**]

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
[*]samiraharshani99@gmail.com, [**]isakakalapani678@gmail.com



ප්‍රමුඛ පදඃ ශ්‍රී ලංකාව, සෙල්ලිපි, පුරාණ, ගිණුම්කරණය


## හැඳින්වීම

මානව සමාජයේ මූල්‍ය ක්‍රමය හා සම්බන්ධව පැවති මූල්‍ය ගිණුම්කරණය ආරම්භවූයේ එක්වරම අහම්භයකින් නොවේ. ඒ සඳහා මානවයා ක්‍රමයෙන් ශිෂ්ඨ බවට පත්වීම හා සාමූහික වශයෙන් ජීවත් වීමට යොමුවීම සමාජ අවශ්‍යතා පෙරට වඩා වැඩි වීම නිෂ්පාදන ක්‍රියාවලිය ඇරඹීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. ශ්‍රී ලංකාවේ පුරාණ ගිණුම්කරණය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍ර මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් ද හොඳ පිටිවහලක් ලැබේ. ඒ අනුව පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර අතරින් සෙල්ලිපි ශ්‍රී ලංකාවේ පුරාණ ගිණුම්කරණය පිළිබඳ අධ්‍යයනය කිරීමට ඇති වැදගත් මූලාශ්‍රයකි.

රටක ආර්ථික ක්‍රියාවලිය මූල්‍ය කළමනාකරණය පවතින රජය මගින් සිදු කෙරේ. අතීතයේ දී මෙම ක්‍රියාදාමය එලෙසින්ම ක්‍රියාත්මක වූ බවට සෙල්ලිපි මගින් පැහැදිලි කරයි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පුරාණ ගිණුම්කරණය පිළිබඳ ව සෙල්ලිපි ඇසුරින් අධ්‍යයනය කිරීමයි. එහිදී පුරාණ ගිණුම්කරණය හා සම්බන්ධ වූ විවිධ තනතුරු පැවති බව සෙල්ලිපි මගින් අනාවරණය වෙයි. එසේම අතීතයේ පැවති පොළී ක්‍රම මෙන්ම මුදල් භාවිතය පිළිබඳවද තොරතුරු දැන ගැනීමට හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනය හරහා පුරාණයේ ගිණුම්කරණය කෙසේ සිදුවූයේ ද යන්න යම් අදහසක් සෙල්ලිපි මගින් ලබාගත හැකිය.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සිදු කිරීමේදී දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය ලෙස සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේදයන් භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේ දී හඳුනා ගන්නා ලද දත්ත වගුගත කරන ලදී. ඉන්පසු විශ්ලේෂණය කරමින් ශ්‍රී ලංකාවේ පුරාණයේ සිට පැවතගෙන එන ගිණුම්කරණය පිළිබඳව සෙල්ලිපි ඇසුරු කරගෙන අදහසක් ලබා දීමට බලාපොරොත්තු වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ පුරාණ ගිණුම්කරණය පිළිබඳ ව සෙල්ලිපිවල සඳහන් වේ. එහිදී මේ හා සම්බන්ධ වූ විවිධ තනතුරු ද වෙයි. එම තනතුරු අතර භාණ්ඩාගාරික හා රූපදර්ශක යන නිලයන් ප්‍රධාන වෙයි. අනුරාධපුර යුගයේ මුල් සමයේ සිටම භාණ්ඩාගාරය පාලනයට භාණ්ඩාගාර ප්‍රධානියෙකු සිටි බව සෙල්ලිපිවල සඳහන්ය. භාණ්ඩාගාරික යනු බදු මුදල් ආදිය බාරව සිටි නිලධාරියෙකි. මුල් අවධියේ ඇමතියන් ද මේ නිලය දැරූ බවත් ඇතැම්විට ඒ ඇමති ආදීනටද භාණ්ඩාගාරිකයන් සිටි බව පෙනේ. මුල් කාලයේ මෙසේ වුවත් මෙහි තත්ත්වය කල්යත්ම වෙනස්ව ගියේය. භාණ්ඩාගාරය

නැමැති රාජකීය සංස්ථාවෙහි ප්‍රධානියා අයබදු එකතු කරන සංවිධානයේ ප්‍රධානියා ද බඩගරික හෙවත් භාණ්ඩාගාරික නමින් සඳහන් වී ඇත. භාණ්ඩාගාරික යනු රජයේ උසස් නිළධාරියෙකි. මෙම භාණ්ඩාගාරික තනතුර සම්බන්ධයෙන් පූර්ව බ්‍රාහ්මීය සෙල්ලිපිවල මෙන් ම අපර බ්‍රාහ්මීය සෙල්ලිපිවල ද සඳහන් වෙයි. භාණ්ඩාගාරික තනතුර පිළිබඳ සඳහන් සෙල්ලිපි අතරින් කිහිපයක් අපි අධ්‍යයනයට යොමුකර ගත්තෙමු. එනම්,

(1) මිහින්තලා කන්දේ අපර බ්‍රාහ්මී ලිපි

1.1."බඩකරික- පරුමක සගන පුත පරුමක උතිය වී වාන ලෙන "

"භාණ්ඩාගාරික ප්‍රමුඛ සංඝගේ පුත්‍ර ප්‍රමුඛ උත්තියගේ විවොන නම් ලෙන "

1.2."සිධ බඩකරි සගහ පුති උතිය"

"යහපතක් වේවා භාණ්ඩාගාරික සංඝගේ පුත්‍ර "

(2) රජගිරි කන්දේ පූර්ව බ්‍රාහ්මී ලිපි

2.1 "පරුමක ශෙන පුත බඩකරික පරුමක සෙනහ ලෙනෙ"

"ප්‍රමුඛ ශෙනගේ පුත්‍ර භාණ්ඩාගාරික ප්‍රමුඛ සෙනගේ ලෙන "

2.2."බඩකරික පරුමක ශෙනහ ලෙනෙ ශගශ "

"භාණ්ඩාගාරික ප්‍රමුඛ සෙනේගේ ලෙන සංඝයාට"

2.3."බඩකරික පරුමක ශෙනහ බරිය උපශිබ ශමනය ලෙනේ ශගස"

"භාණ්ඩාගාරික ප්‍රමුඛ ශෙනගේ බිරිඳවන ශුමනා උපාසිකාවගේ ලෙන සංඝයාට"

මෙම රජගිරි කන්දේ පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපිවලින් පෙනී යන්නේ භාණ්ඩාරිකයන් සහ ඔවුන්ගේ බිරින්දෑවරුන් පවා මහා සංඝයාට ලෙන් පූජා කර ඇති බවයි. ඒ අනුව සමාජයේ ධනවත් උසස් නිලධාරි පිරිසක් ලෙස මොවුන් හඳුන්වා දිය හැකිය.

3. තෝරමයිලෑව විහාර ලිපිය

"මහ රජ හා පණිත බඩකරික පරුමක ශුමනහ..........."

"මහරජුගේ ඉතාමත්ම යහපත් භාණ්ඩාගාරික වූ පරුමක ශුමනගේ "

මේ අනුව භාණ්ඩාගාරික යනු රජුට ඉතාමත්ම සමීප පුද්ගලයෙකි.

(4) පෙරිමියම්කුලම් ගිරි ලිපිය

"........පලොනකරක වවිය දකපති මතර මපිබක දිනි බඩකරිය බතකයහ පුති අයිසයිහ නවකනකයහ පතන ගලෙහිය පිනපටිසතරිය කමකරනකකොටු..........."

".......පලොනකර නම් වැවෙහි දිය බද්ද හා මත්ස්‍ය බද්ධ භාණ්ඩාගාරික බතකගේ පුත්‍ර සයිහ කුමාරයා පධානගරයේ අඳුන් දිවිසන් ඇති කිරීමේ කාර්යය කිරීමට ......"

තව ද පාලකයන් මාරු වුව ද මෙම භාණ්ඩාගාරිකයන් මාරු නොවී කටයුතු කර ගෙන ගිය බව රුවන්වැලි සෑ සලපතල මළුවෙහි ඇති කල්‍යාණවතී රැජිණ කාලයට අයත් ශිලා ලිපියේ සඳහන්ය. එහි සඳහන් භාණ්ඩාගාරික මහා පැරකුම්බා රජුගේත් කල්‍යාණවතී රැජිණගේත් භාණ්ඩාගාරික ලෙස සඳහන්කර තිබීමෙන් සනාථ වෙයි.

"සිරි සඟ බෝ පරාක්‍රමබාහු චක්‍රවර්තී
ස්වාමීන්වහන්සේ ඇතුළු වූ
රජදරුවන්ගේ භාණ්ඩාගාර පරිපාලනය
කොට රත්නත්‍රයෙහි අධිකප්‍රාසාද ඇති "

එසේ ම සෙල්ලිපිවල රූපදර්ශක නමින් සඳහන් වෙයි. එනම්. කාසි වෙළඳ කටයුතු හා රාජ්‍ය භාණ්ඩාගාරයට ගැනීමේ දී පරීක්ෂා කරන තනතුරක් වෙයි.

පුරාණයේ රජයේ අයවැය පාලනය කළේ කෙසේදැයි දැනගැනීමට වාර්තා නැතත් විශාල වශයෙන් ආදායම් ලැබෙන වෙනත් ආයතනවල මුදල් පාලනයට රජය මගින් පනවා තිබූ නීතිරීති රජයේ

මුදල් පාලනය සම්බන්ධ අනුගමනය කළ ක්‍රියාමාර්ග අනුව සකස්කරන ලද බව සැළකිය හැකිය. මේ අනුව විශාල වශයෙන් ආදායම් ලබන අභයගිරිය, ගිරිතලය ආදි ස්ථානවල ආදායම් පාලනවට පනවා ඇති නීතිරීති සෙල්ලිපිවල කොටා ඇත. ක්‍රි. ව. නවවන සියවසට අයත් කපාරාරාම ලිපියේ ද එම කළුදිය පොකුණ ලිපියේ ද මෙම තොරතුරු සඳහන්ය. පස්වන කාශ්‍යප රජුගේ අභයගිරි පුවරු ලිපියේ අභයගිරියේ ආදායම් ලැබෙන ස්ථාන ලෙස දාන ශාලාව, බෝධිඝරය, රත්නප්‍රාසාදය, පොහොය ගෙය, අභයගිරි දාගැබ දක්වා ඇත.

අභයගිරි කපාරාරාම ලිපියේ පිරිවෙන් පරිපාලන භික්ෂූන් එක් වී ආදායම් හා වියදම් විස්තර ලබා ගැනීමට අට දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් හා සභාවක් පත් කර තිබූ බව පැහැදිලිය.

දසවන සියවසට අයත් වෙස්සගිරි පුවරු ලිපියේ රන් කළන් 200ක් තැන්පත් කොට වසරකට 15% ක් පොළිය අපේක්ෂාකර එම පොළියෙන් සෑම මසකම පොහෝ දිනයේ දී භික්ෂූන්ට අක එකක් වටිනා හකුරු සහ අක එකක් වටිනා ගිතෙල් සැපයීමට නියම කර ඇත.

පාලුමැකිච්චාව ලිපියේ සහ ලබු ඇට බැඳි ලිපියේ වෙස්සගිරියේ සෙල්ලිපියක කහවනු පිළිබඳ සඳහන් වෙයි. ගලපාත විහාර ලිපියේ රන් දී ඉඩම් යායක් මිලට ගෙන පුවක් වගා කිරීම පිළිබඳ සඳහන්ය. මේ අනුව ශ්‍රී ලංකාවේ පුරාණයේ සිට පැවති මුදල් පිළිබඳව මෙයින් අනාවරණය වෙයි.

මෙම අධ්‍යයනය හරහා ශ්‍රී ලංකාවේ පුරාණ ගිණුම්කරණය පිළිබඳ සෙල්ලිපි ඇසුරින් පවතින දැනුම වැඩි දියුණුකර ගැනීමටත් අතීතයේ කුමන අයුරින් ගිණුම්කරණ කටයුතු සිදු වූයේ ද යන්න අවබෝධයක් ලබා ගැනීමටත් අතීතය හා වර්තමානය අතර පවත්නා වූ වෙනස මෙන්ම ක්‍රමික විකාශනය පිළිබඳ යම් අවබෝධයක් මෙයින් ලබා ගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ

කුලතුංග, ටී.ජී. (2015) ***ශ්‍රී ලංකාවේ කාසි හා මුදල් ව්‍යවහාරය.*** මධ්‍යම සංස්කෘතික අරමුදල. කොළඹ 07.

අමරවංශ හිමි, කොත්මලේ (1969) **ලක්දිව සෙල්ලිපි.** ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10